සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජුලි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2018-07-21
පෙරවරු
[8.45 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූලික ගුණාත්මක ලක්ෂණයන්ට අමතරව, අදාල බවින් සහ විශ්වසනීය නියෝජනයෙන් යුක්ත වූ තොරතුරක, ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කරනු ලබන වෙනත් ගුණාත්මක ලක්ෂණයන්ද වේ. අදාල බව සහ විශ්වසනීය නියෝජනය යන දෙකම එක සමාන වශයෙන් සලකන අවස්ථාවකදී කිසියම් සංසිද්ධියක් නිරූපණය කිරීම සඳහා කවරක් යොදාගත යුතුදැයි තීරණය කිරීමට ගුණාත්මක ලක්ෂණවල වැඩිදියුණු කිරීම් උපකාරී වේ.

**ඔබ විසින් කළ යුතු දැ:**

තොරතුරක ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කිරීමට ඉවහල් වන ගුණාත්මක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාවක (an integrated report) මූලික අරමුණ වන්නේ කාලයත් සමඟ කිසියම් සංවිධානයක වටිනාකම් (value) නිර්මාණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව මූල්‍ය ප්‍රාග්ධනය සපයන්නන් වෙත පැහැදිලි කරදීමයි. සංකලිත වාර්තාවක ප්‍රධාන සංරචක අටක් ඇතුලත්ය. සංකලිත වාර්තාවක ඇතුලත් සංරචක අතරින් දෙකක් ලෙස ව්‍යාපාරික ආකෘතිය (business model) සහ සංවිධානමය විශ්ලේෂණය සහ බාහිර පරිසරය දැක්විය හැකිය.

**ඔබ විසින් කළ යුතු දැ:**

සංකලිත වාර්තාවක ව්‍යාපාරික ආකෘතිය තුළ අන්තර්ගත ප්‍රධාන ක්ෂේත්‍ර (key areas) දෙකක්(02) සහ සංවිධානමය විශ්ලේෂණය හා බාහිර පරිසරය තුළ අන්තර්ගත ප්‍රධාන ක්ෂේත්‍ර තුනක්(03) **සඳහන් කරන්න.**

(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ඔෂිටා ට්‍රාන්ස්පෝට් සර්විසස් සමාගම,** රු. මිලියන 6.5 ක වටිනාකමකට බර වාහනයක් (heavy vehicle) මිලදී ගන්නා ලදී. 2017 අප්‍රේල් 01 දින එයට අදාල මූලික තැන්පතුව ලෙස රු. මිලියන 1.5 ක් ගෙවූ අතර, ඉතිරි වටිනාකම (රු. මිලියන 5) සඳහා එදිනම **සීමාසහිත AB බැන්ක් සමාගම** සමග මූල්‍ය කල්බදු ගිවිසුමකට එළඹුණි. කල්බදු ගිවිසුමට අදාල කොන්දේසි පහත පරිදි වේ:

| | |
|---|---|
| වාර්ෂික කල්බදු වාරිකය | රු.1,473,959/- |
| කාලසීමාව | අවුරුදු 5 |
| පොලී අනුපාතිකය | වාර්ෂිකව 14.5% |
| කල්බදු වාරිකය ගෙවිය යුතු දිනය | සෑම වර්ෂයකම මාර්තු 31 දින |

වාහනයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වූ අතර, සමාගම, එය ක්ෂය කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය යොදාගනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත කරුණුවලට අදාලව, 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයන් (extracts) **පිළියෙල කරන්න**.

*(කල්බදු වාරික, නියමිත දිනයන්හිදී ගෙවා ඇතැයි උපකල්පනය කරන්න).* (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ජැස් සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) **සීමාසහිත ජැස් සමාගම** 2018 පෙබරවාරි 01 දින එකක් රු.10/- ක් බැගින් වූ නිකුතු මිලකට (issue price) සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කරන ලදී. මෙම සම්පූර්ණ ප්‍රතිප්ඨාවෙන්, අයදුම්කිරීමේදී 2018 මාර්තු 20 දිනට පෙර එක් කොටසකට රු.6/- ක් බැගින් ගෙවිය යුතු අතර, එක් කොටසකට රු.4/- බැගින් වූ ඉතිරි මුදල 2018 අප්‍රේල් 10 දින විභජනයේදී ගෙවිය යුතු විය. සමාගම වෙත කොටස් 120,000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර, අතිරික්ත අයදුම්පත් ඒවාට අදාල මුදල් ද සමඟ 2018 මාර්තු 30 දින ප්‍රතික්ෂේප කර යවන ලදී.

(2) සමාගම, 2018 ජනවාරි 01 දින **ABC බැංකුවෙන්** රු. මිලියන 5 ක බැංකු ණය මුදලක් ලබාගන්නා ලදී. ණය ගිවිසුමට අනුව ණය ආපසු ගෙවීම 2018 ජනවාරි 31 දින සිට ආරම්භ කළ යුතු අතර, වාරික ගෙවූ ආකාරය පහත සඳහන් පරිදි වේ:

| | **ගෙවූ සම්පූර්ණ වාරිකය (රු.)** | **පොලී ප්‍රමාණය (රු.)** |
|---|---|---|
| 2018.01.31 | 77,955 | 68,700 |
| 2018.02.28 | 77,955 | 64,200 |
| 2018.03.31 | 77,955 | 61,380 |
| **එකතුව** | **233,865** | **194,280** |

(3) සමාගම, 2018 මාර්තු 31 දින රු.750,000/- ක බැංකු අයිරා පහසුකමක් ලබාගන්නා ලදී.

(4) සමාගම, 2018 මාර්තු 31 දින එහි ආරම්භක සේවකයෙකුට රු.1,000,000/- ක දිගුකාලීන ණයක් ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කටයුතුවලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න.**

(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත මල්ටි කෙමි එක්ස්පෝට් (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31, 2017 මාර්තු 31 සහ 2016 මාර්තු 31 යන දිනවලින් අවසන් වූ වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල සහ 2018 මාර්තු 31, 2017 මාර්තු 31 සහ 2016 මාර්තු 31 දිනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් පහත පරිදි වේ:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2018 මාර්තු 31 | 2017 මාර්තු 31 | 2016 මාර්තු 31 |
|---|---|---|---|
| පිරිවැටුම | 127,500 | 105,000 | 133,000 |
| විකුණුම් පිරිවැය | 88,500 | 71,200 | 93,100 |
| දළ ලාභය | 39,000 | 33,800 | 39,900 |
| ආදායම් බදු | 2,240 | 1,070 | 1,980 |
| බදු පසු ලාභය | 8,020 | 8,130 | 12,020 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| දිනට | 2018 මාර්තු 31 | 2017 මාර්තු 31 | 2016 මාර්තු 31 |
|---|---|---|---|
| ජංගම වත්කම් | 20,470 | 26,260 | 38,000 |
| ජංගම වගකීම් | 13,200 | 17,875 | 12,280 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 15,460 | 14,220 | 18,900 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 6,400 | 6,100 | 8,440 |
| තොගය | 2,680 | 11,530 | 18,650 |
| කොටස්කරුවන්ගේ ස්කන්ධය | 39,540 | 31,520 | 23,390 |

සම්පූර්ණ පිරිවැටුමෙන් 55% ක් ණයපදනම මත සිදුකරන ලද විකුණුම් යැයි උපකල්පනය කරන්න. තවදුරටත්, විකුණුම් පිරිවැයෙන් 90% ක් ගැනුම්වලින් සමන්විත වන අතර, එයින් 70% ක ප්‍රමාණයක් ණයපදනම මත සිදුකරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 යන දිනවලින් අවසන් වර්ෂ සඳහා / අවසන් දිනවලට **සීමාසහිත මල්ටි කෙමි එක්ස්පෝට් (පෞද්ගලික) සමාගමේ** කාර්යසාධනය පහත සඳහන් අනුපාත සැලකිල්ලට ගනිමින් **විශ්ලේෂණය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) ශුද්ධ ලාභ අනුපාතය.

(c) ක්ෂණික වත්කම් අනුපාතය.

(d) ණයගැති එකතුකිරීමේ කාලය.

(e) ණයහිමි ගෙවීමේ කාලය. (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සෙවන් රෝසස් සමාගමේ** 2017 මාර්තු 31 සහ 2018 මාර්තු 31 යන දිනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත සෙවන් රෝසස් සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | 2018 මාර්තු 31 දිනට | | 2017 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්:** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 46,000 | | 56,000 | |
| සමුච්චිත ක්ෂය | (24,000) | | (20,000) | |
| ධාරණ අගය | | 22,000 | | 36,000 |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 16,000 | | 5,800 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 33,500 | | 29,400 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 3,500 | 53,000 | 5,000 | 40,200 |
| **මුළු වත්කම්** | | **75,000** | | **76,200** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 50,000 | | 50,000 |
| රඳවාගත් ඉපැයීම් | | 7,200 | | 6,000 |
| | | 57,200 | | 56,000 |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් | 17,700 | | 19,800 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 100 | 17,800 | 400 | 20,200 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **75,000** | | **76,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සමාගම, වර්ෂය තුළදී එහි සාමාන්‍ය කොටස්හිමියන්ට රු.2,000,000/- ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

(2) සමාගම විසින් 2015 අප්‍රේල් 01 දින රු. මිලියන 10 ක පිරිවැයකට මිලදී ගන්නා ලද යන්ත්‍රයක් 2018 මාර්තු 31 දින රු. මිලියන 4 ක මුදලකට විකුණන ලදී. යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 05 කි.

(3) වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් කිසිවක් සිදුවී නොමැත.

(4) 2017/18 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ඇස්තමේන්තුගත ආදායම් බදු වියදම රු.450,000/- කි.

ඉහත තොරතුරු උපයෝගී කරගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සෙවන් රෝසස් සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය</u> භාවිත කර **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත SRL සමාගමේ** පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

සමාගම, 2017 අප්‍රේල් 01 දින පිරියත සහ යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන ලදී. එම සමාලෝචනයට අනුව පිරියත සහ යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 3 සිට 8 දක්වා 2017 අප්‍රේල් 01 දින සිට වෙනස් කිරීමට තීරණය කරන ලදී. 2017 අප්‍රේල් 01 දිනට පිරියත සහ යන්ත්‍රවල පිරිවැය සහ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.8,000,000/- ක් හා රු.3,200,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි පිළිබඳ වූ (LKAS 8) ප්‍රමිතිය අනුව ඉහත සඳහන් අවස්ථාව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණයේදී සලකා බලනු ලබන ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත XYZ සමාගමේ** පහත සඳහන් තොරතුරු ලබාදී ඇත:

(1) අස්තිත්වය වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. එම වගකීම් සහතිකය මගින් භාණ්ඩ මිලදීගෙන පළමුවන මාස හය ඇතුලත සිදුවන නිෂ්පාදන දෝෂ වෙනුවෙන් සිදුකරනු ලබන නඩත්තු කිරීම් සඳහා දරණු ලබන පිරිවැය ආවරණය කරනු ලබයි. අස්තිත්වයේ අතීත අත්දැකීම් අනුව විකුණුම්වලින් 2% ක ප්‍රමාණයක් වගකීම් සහතික මත නඩත්තු පිරිවැය ලෙස දැරීමට සිදුවන අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 30 ක විකුණුම් වාර්තාගත වී ඇත. වර්ෂය පුරා විකුණුම් සමාන ලෙස සිදුවී තිබී ඇති බව උපකල්පනය කරන්න.

(2) 2015/16 තක්සේරු වර්ෂයට අදාලව දැරූ වියදම්වල ඉඩ නොදුන් කොටසක් සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රු. මිලයන 2.5 ක ආදායම් බදු තක්සේරුවක් එවා තිබුණි. පිළිතුරු ලිපි කිහිපයක් සහ වියදමට සම්බන්ධ ලියකියවිලි යැවීමෙන් පසු අවසන් ඇස්තමේන්තුව ලෙස රු. මිලියන 2 ක් බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2018 මාර්තු 30 දින නියම කරන ලදී. මෙය මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබුණි.

(3) 2018 මාර්තු 25 දින සේවකයෙකු විසින් සිදුකරන ලද වංචාවකට අදාලව සමාගම විසින් එම සේවකයා සේවයෙන් පහකරන ලද අතර, අදාල සේවකයා එකී සිද්ධියට, සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමත කළ දිනය දක්වා සමාගමේ නීතිඥයන්ගේ උපදේශය වූයේ මෙකී සිද්ධියට අදාලව සමාගම වෙත වගකීමක් ඇතිවීමේ හැකියාවක් නොමැති බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම්, සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත සඳහන් එක් එක් අවස්ථාව හඳුනාගත යුතු ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ගෝල්ඩන් පොදු සමාගමේ** 2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**සීමාසහිත ගෝල්ඩන් පොදු සමාගම**

**2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය - කොටස් 5,000,000 | | 50,000 |
| 2017 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 13,350 |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට): | | |
| ඉඩම් සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම - රු. මිලියන 30) | 40,000 | |
| මෝටර් වාහන | 28,000 | |
| කාර්යාල උපකරණ | 8,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 4,000 |
| මෝටර් වාහන | | 6,000 |
| කාර්යාල උපකරණ | | 1,500 |
| කෙටිකාලීන ආයෝජන | 25,000 | |
| 2018 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) | 30,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 87,000 | 101,850 |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 1,150 |
| උපචිත වියදම් | | 800 |
| 2016/17 තක්සේරු වර්ෂයට අදාලව ගෙවිය යුතු ආදායම් බදු | | 2,000 |
| 15% බැංකු ණය | | 5,000 |
| බැංකුවේ මුදල් | 1,200 | |
| අ'තැති මුදල් | 600 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 420,000 | 545,000 |
| ආයෝජන ආදායම් ලැබීම් | | 2,800 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 5,000 | |
| පරිපාලන වියදම් | 37,000 | |
| බෙදාහැරීමේ වියදම් | 41,500 | |
| මූල්‍ය වියදම් | 1,350 | |
| ගෙවූ ආදායම් බදු | 8,800 | |
| | **733,450** | **733,450** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2013 අප්‍රේල් 01 දින එකක් රු.60,000/- බැගින් මිලදී ගන්නා ලද පරිගණක 5 ක් 2017 දෙසැම්බර් 31 දින සමාගම විසින් ඉවත්කරන ලදී. එක් පරිගණකයක් ඉවත් කිරීමේ වටිනාකම රු.10,000/- බැගින් විය. මෙම ගනුදෙනුවට අදාලව මුදල් තවමත් සමාගම වෙත ලැබී නොමැති අතර, පරිගණක ඉවත් කිරීමට අදාලව ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

(2) සමාගමට නව ගබඩාවක් ඉදිකිරීම වෙනුවෙන් 2017 අප්‍රේල් 01 දින 15% වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 5 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. ගබඩාව ඉදිකිරීමේ කටයුතු 2017 මැයි 01 දින ආරම්භ කරන ලද අතර, 2017 දෙසැම්බර් 31 දින එය භාවිතය සඳහා නිමකරන ලදී. බැංකු ණය මුදල, ගබඩාව ඉදිකිරීම වෙනුවෙන් සම්පූර්ණයෙන්ම භාවිතා කරන ලද අතර, නව ගබඩාවේ පිරිවැය ලෙස රු. මිලියන 5 ගොඩනැගිලි ගිණුමට ඇතුලත් කර ඇත.

වර්ෂය තුළදී සමාගම ණය ආපසු ගෙවීමක් සිදු නොකළ අතර, 2018 මාර්තු 31 දිනට පැවති ණය මුදලෙන් ¼ ක ප්‍රමාණයක් ඊළඟ වර්ෂය තුළදී පියවිය යුතු විය.

(3) 2018 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.32,000,000/- කි.

(4) 2018 මාර්තු 01 දින සමාගම විසින් එහි ඉඩම් ප්‍රත්‍යාගණනය කරන ලද අතර, ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් ඉඩම් වටිනාකම රු. මිලියන 1.5 කින් වැඩිවිය. මෙය ගිණුම් පොත්වල මෙතෙක් වාර්තාකර නොතිබුණි.

(5) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | අවුරුදු 25 |
| මෝටර් වාහන | : | අවුරුදු 05 |
| කාර්යාල උපකරණ | : | අවුරුදු 10 |

(6) 2018 මාර්තු 31 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් රු.1,500,000/- ක ප්‍රමාණයක් බොල්ණය බවට පත් වී ඇත. 2018 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් 2% ක ප්‍රමාණයකට සාමාන්‍ය ප්‍රතිපාදනයක් කළ යුතු වේ.

(7) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආයෝජන ආදායම රු.4,000,000/- කි.

(8) 2017/18 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වගකීම රු.9,000,000/- ක් ලෙස ඇස්තමේන්තු ගතකර ඇත.

(9) 2018 මැයි 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා අවසන් ලාභාංශය ලෙස සාමාන්‍ය කොටසකට ශත 50 ක් බැගින් වූ ලාභාංශයක් ගෙවීමට තීරණය කරන ලදී.

(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ජුනි 10 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ගෝල්ඩන් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 07)

(c) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) 2017 අප්‍රේල් 01 දින **සීමාසහිත ටයිනි ටෝයිස් සමාගමේ (TT)** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 20 කට **සීමාසහිත මෙගා ට්‍රේඩිං සමාගම (MT)** විසින් අත්පත් කරගන්නා ලදී. 2018 මාර්තු 31 දිනට **MT** සහ **TT** සමාගම්වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ:

**2018 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | MT | TT |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ – පිරිවැයට | 60,000 | 15,000 |
| – සමුච්චිත ක්ෂය | (12,000) | (6,000) |
| ධාරණ අගය | 48,000 | 9,000 |
| TT හි ආයෝජනය | 20,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 15,100 | 18,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 40,250 | 10,500 |
| | 55,350 | 28,500 |
| **මුළු වත්කම්** | **123,350** | **37,500** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 78,000 | 20,000 |
| රඳවාගත් ඉපැයීම් | 8,750 | 4,600 |
| | 86,750 | 24,600 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 10,600 | - |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 15,100 | 10,500 |
| බැංකු ණය | 4,800 | - |
| බැංකු අයිරාව | 6,100 | 2,400 |
| | 26,000 | 12,900 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **123,350** | **37,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, **TT සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු.1,200,000/- ක් විය.

(2) අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමේ සාධාරණ වටිනාකම රු.5,000,000/- ක් වන අතර, **TT සමාගමේ** හඳුනාගත හැකි වත්කම්වල සාධාරණ අගය ඒවායේ පොත් අගයට සමාන විය.

(3) **MT සමාගම** විසින් 2015 මාර්තු 31 දින රු. මිලියන 2.5 කට මිලට ගත් බෙදාහැරීමේ වෑන් රථයක්, 2017 අප්‍රේල් 01 දින **TT සමාගමට** රු. මිලියන 3 කට විකුණන ලදි. සමාගම් දෙකේම මෝටර් වාහන සරල මාර්ග ක්‍රමය යටතේ වර්ෂ 5 ක් පුරා පිරිවැය මත ක්ෂය කරනු ලබයි.

(4) වර්ෂය තුළ **TT සමාගම** විසින් **MT සමාගම** වෙත පිරිවැයට 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ රු.600,000/- කට විකුණන ලදි. එකී භාණ්ඩවලින් ½ ප්‍රමාණයක් **MT සමාගමේ** 2018 මාර්තු 31 දිනට ඇති තොගය තුළ අන්තර්ගත විය.

(5) **TT සමාගමේ** වෙළෙඳ ලැබිය යුතු මුදල් තුළ විකුණුම් ගනුදෙනුවලට අදාලව **MT සමාගමෙන්** ලැබිය යුතු රු.25,000/- ක මුදල් ප්‍රමාණයක් අන්තර්ගත වේ.

ඉහත තොරතුරු උපයෝගී කරගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2018 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 14)

(B) **සීමාසහිත ඩයිනමික් එන්ටප්‍රයිසස් සමාගමේ** 2017 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනවලින් අවසන් මූල්‍ය වර්ෂවල කාර්යසාධනයට අදාලව පහත අනුපාත ගණනය කර ඇත:

| | **2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2017 මාර්තු 31දිනෙන් අවසන් වර්ෂය සඳහා** |
|---|---|---|
| තෝලන අනුපාතය (Gearing Ratio) | 82% | 65% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 20% | 35% |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | වාර 5 | වාර 3 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත වර්ෂ දෙක සඳහා ගණනය කර ඇති එක් එක් අනුපාත සැලකීමේදී ඒවායේ වෙනස්වීම්වලට තුඩුදෙන ලදැයි සිතිය හැකි හේතු දෙක(02) බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |